# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1809/13 - 2013 මැයි මස 09 වැනි බ්‍රහස්පතින්දා - 2013.05.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත 3 වැනි වගන්තිය යටතේ නියෝගය**

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම මෙහි I වැනි උපලේඛනයේ I වැනි තීරුවේ නිශ්චිතව දක්වා ඇත්තා වූද, එම ලෙබනයේ II වැනි තීරුවෙහි ඉම් සහ මායිම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තා වූද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, එම ප්‍රදේශය ඒ වගන්තියේ කාර්යය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

මහින්ද රාජපක්ෂ,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය.

2013 අප්‍රේල් මස 23 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය I

**පැල්මඩුල්ල නාගරික සංවර්ධන ප්‍රදේශය**

*I වන තීරුව*

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ, පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටියා වූ අංක 171සී දොඹගස්වින්න, 171බී ගොඩගම, 167 ගනේගම, 166 කුට්ටපිටිය, 166ඒ උඩතුල, 168සී වාරිගම, 168 දෙනවක උඩකඩ, 168ඩී බොරාල, 168ඒ පැල්මඩුල්ල නගරය, 170 පනාවැන්න, 170සී කපුහේන්තොට, 167බී ඉහළ බෝපිටිය, 168බී පැල්මඩුල්ල ගම, 167ඩී පහල බෝපිටිය, 167සී රිල්ලහේන, 171 දෙනවක පාතකඩ, 171ඒ සන්නස්ගම යන ග්‍රාම නිලධාරී කොට්ඨාසවලින් සමන්විත වන්නා වූ II තීරුවෙහි සඳහන් අයුරු මායිම් වන්නා වූ මුළු මහත් භූමි ප්‍රදේශය.

*II වන තීරුව*

උතුර :

රත්නපුර - බලංගොඩ ප්‍රධාන මාර්ගයෙහි මධ්‍ය රේඛාව පළුගම්මන මාර්ගයෙහි මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යයේ සිට ගිණිකොණ දෙසට රත්නපුර, බලංගොඩ ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ දොඹගස්වින්න මාර්ගයෙහි මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට ඊසාන, ගිණිකොණ හා ඊසාන දෙසට ඇඳි රේඛව දොඹගස්වින්න මාර්ගයෙහි මධ්‍ය රේඛාව ඔස්සේ දෙණවක ගඟෙහි මධ්‍ය රේඛාව ඡේදනය කරන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට උතුරු දෙසට දෙඹගහවින්න මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ තුඹදෙණිය හන්දිය දක්වා ද, එතැන් සිට ඊසාන, ගිණිකොණ හා නැවතත් ඊසාන දෙසට තුඹදෙණිය මාර්ගයෙහි මධ්‍ය රේඛාව ඔස්සේ ඉන් දොලෙහි මධ්‍ය රේඛාව ඡේදනය කරන ලක්ෂ්‍යය දක්වාද, එතැන් සිට ඉන් දොලෙහි මධ්‍ය රේඛව ඔස්සේ ගිණිකොණෙ දෙසට ගලමුනේ දොලෙහි මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද, එතැන්



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

සිට ගලමුනේ දොලෙහි මධ්‍ය රේඛාව ඔස්සේ ඊසාන දෙසට ඇදි රේඛාව දෙනවක මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද, එතැන් සිට දෙනවක මාර්ගයෙහි මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු හා ගිණිකොණ දෙසට ඇදි රේඛාව වැල් අඳුරගොඩ මාර්ගයෙහි මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට වැල් අඳුරගොඩ මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ඊසාන දෙසට ඇදි රේඛාව ගනේගම ග්‍රාම නිලධාරී වසමෙහි උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා, එතැන් සිට ගනේගම ග්‍රාම නිලධාරී වසමෙහි උතුරු මායිම ඔස්සේ ගිණිකොණ, ඊසාන හා ගිණිකොණ දෙසට ඇදි රේඛාව ගනේගම වසමෙහි නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද, එතැන් සිට ගනේගම ග්‍රාම නිලධාරී වසමෙහි නැගෙනහිර මායිම ඔස්සේ දකුණු දෙසට ඇදි රේඛාව පැල්මඩුල්ල නගර ග්‍රාම නිලධාරී වසමෙහි උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද, එතැන් සිට නැගෙනහිර දෙසට ඇදි රේඛාව පැල්මඩුල්ල නගර ග්‍රාම නිලධාරී වසමෙහි උතුරු මායිම ඔස්සේ, පැල්මඩුල්ල ගම ග්‍රාම නිලධාරී වසමෙහි උතුරු මායිම හමුවන තෙක්ද, එතැන් සිට පැල්මඩුල්ල ගම ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම ඔස්සේ ඊසාන දෙසට පැල්මඩුල්ල ගම ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට පැල්මඩුල්ල ගම ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම ඔස්සේ ගිනිකොන දෙසට දෙනවක උඩකඩ ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම හමුවන තෙක්ද, එතැන් සිට ගිණිකොණ දෙසට ඇදි රේඛාව දෙනවක උඩකඩ ග්‍රාම නිලධාරී වසමෙහි උතුරු මායිම ඔස්සේ කුඹුකේ දොලෙහි මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද, එතැන් සිට නිරිත දෙනට කුඹුකේ දොලෙහි මධ්‍ය රේඛාව ඔස්සේ ඇදි රේඛාව දෙනවක ඇලෙහි මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද, එතැන් සිට නැගෙනහිර දෙසට ඇදි රේඛාව දෙනවක ඇලෙහි මධ්‍ය රේඛාව ඔස්සේ මොරතොර ග්‍රාම නිලධාරී වසම් උතුරු මායිම් හමුවන තෙක්ද, එතැන් සිට මොරතොට ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම ඔස්සේ ගිණිකොණ දෙසට වෙනිවැල්පිටිය මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද ;

*නැගෙනහිර :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට ගිණිකොණ හා නිරිත දෙසට ඇදි රේඛාව පැල්මඩුල්ල - බලංගොඩ මාර්ගය හරහා කෙටේතැන්න - බොරාල මාර්ගයෙහි මධ්‍ය රේඛාව ඔස්සේ රත්නපුර - ඇඹිලිපිටිය ප්‍රධාන මාර්ගයෙහි මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට ගිණිකොණ දෙසට ඇදි රේඛාව පැල්මඩුල්ල - ඇඹිලිපිටිය ප්‍රධාන මාර්ගයෙහි මධ්‍ය රේඛාව ඔස්සේ පොරෝණුව - කෙටේතැන්න මාර්ගයෙහි මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද ;

*දකුණ :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට බස්නාහිර දෙසට ඇදි රේඛාව කපුහේන්තොට ග්‍රාම නිලධාරී වසමෙහි දකුණු මායිම ඔස්සේ එම වසමේ දකුණු හා බස්නාහිර මායිම් හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට කපුහේන්තොට ග්‍රාම නිලධාරී වසමේ බස්නාහිර මායිම ඔස්සේ වයඹ දෙසට ඉහල බෝපිටිය ග්‍රාම නිලධාරී වසමේ දකුණු මායිම හමුවන තෙක්ද, එතැන් සිට ඉහල බෝපිටිය ග්‍රාම නිලධාරී වසමේ දකුණු මායිම ඔස්සේ උතුරු දෙසට හා නිරිත දෙසට ඉහල බෝපිටිය ග්‍රාම නිලධාරී වසමේ බස්නාහිර මායිම හමුවන තෙක්ද ;

*බස්නාහිර :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට වයඹ, බස්නාහිර හා වයඹ දෙසට ඇඳි රේඛාව ඉහල බෝපිටිය ග්‍රාම නිලධාරි වසමෙහි බස්නාහිර මායිම ඔස්සේ රිල්හේන ග්‍රාම නිලධාරී වසමෙහි දකුණු හා බස්නාහිර මායිම් හමුවන ලක්ෂ්‍ය දක්වාද ; එතැන් සිට වයඹ හා ඊසාන දෙසට ඇඳි රේඛාව රිල්හේන ග්‍රාම නිලධාරී වසමේ බස්නාහිර මායිම ඔස්සේ දෙනවක පාතකඩ ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර හා දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද, එතැන් සිට වයඹ දෙනට ඇඳි රේඛාව දෙනවක පාතකඩ ග්‍රාම නිලධාරී වසමෙහි දකුණු මායිම ඔස්සේ දෙනවක පාතකඩ ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම හමුවන තෙක්ද, එතැන් සිට දෙනවක පාතකඩ ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම ඔස්සේ ඊසාන දෙසට සන්නස්ගම ග්‍රාම නිලධාරී වසමේ දකුණු මායිම හමුවන තෙක්ද, එතැන් සිට සන්නස්ගම ග්‍රාම නිලධාරී වසමෙහි දකුණු මායිම ඔස්සේ බස්නාහිර දෙසට ආරම්භක ලක්ෂ්‍ය හමුවන පලුගම්මන මාර්ගයෙහි මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍ය දක්වාද වේ.

05 - 619

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.